Human Rights Commission of Sri Lanka
Library
... Kynsey Road,
Colombo 08.

(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2016.01.07 |

පැමිණිලිකරු : කේ.ජී. නිශාන්ත මයා,
තො 20/3. දෙල්ගහවත්ත.
ස්සේන වත්ත පාර.
වදුරාමුල්ල. පානදුර.

වගඋත්තරකරුවන් : 01 ලේකම්.
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය.
බත්තරමුල්ල.

02 අධ්‍යක්ෂ (ජාතික පාසැල්).
ජාතික පාසැල් අංශය.
අධ්‍යාපන අමාත්‍යාංශ..
ඉසුරුපාය. බත්තරමුල්ල.

03 විදුහල්පති.
ශ්‍රී සුමංගල විද්‍යාලය.
පානදුර.

<u>පැමිණිලි අංකය : **HRC/1982/15**</u>

ඉහත අංක දරණ පෙත්සම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් පෙත්සම්කරු කියා සිටින කරුණු අනුව වගඋත්තරකරුවන්ද කැඳවා කරන ලද පරීක්ෂණ කටයුතු අවසන් කරමින් පෙත්සම සහ ඇමුණුම්ද වගඋත්තරකරුවන්ගේ උත්තර වාද හා ඇමුණුම් ලේඛනද දෙපාර්ශවයේ ලිඛිත ලේඛනද පරීක්ෂණ අවස්ථාවේ ඉදිරිපත් කල කරුණුද අනුව අවසන් නිර්දේශය පහත පරිදි ඉදිරිපත් කරමි


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 165,කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08. | සභාපති / தவிசாளர் / Chairman | 011-2696470 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2696470 | ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrc@sltnet.l |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම් / செயலாளர் / Secretary | 011-2689558 | ක්ෂනික / துரித அழைப்பு / Hotline | 011-2689558, 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

**පෙත්සම තුලින් දක්වා ඇති කරුණු දැක්වීම :-**

පෙත්සම්කරු විසින් තම දරුවා වන කේ. දුල්වන් ලිත්නුක යන අය පාතදුර ශ්‍රී සුමංගල පිරිමි විද්‍යාලයට ඇතුලත් කිරීමට ඉල්ලීමක් සිදුකර 2015.02.25 දින පැවති සම්මුඛ පරීක්ෂණයටද සහභාගි වී ඇති බවත්, විදුහල්පති විසින් ඒ අනුව තෝරා ගත් ළමුන් පිළිබඳ වූ නාම ලේඛනයේ පෙත්සම්කරුගේ දරුවාගේ නමද ඇතුලත් වී තිබූ බවත් දන්වා ඇත. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට විදුහල්පති විසින් අදාළ නාම ලේඛනය යැවූ පසු තෝරා ගන්නා ලද්දේ එකී නාම ලේඛනයේ ඇතුලත් වූ ළමුන් 4 දෙනෙකු සහ නාම ලේඛනයේ නම සඳහන් නොවූ ඊට පරිභාහිර ළමුන් බවද, තම දරුවා සම්මුඛ පරීක්ෂණයේදී තෝරා පත් කර ගත් නාම ලේඛනයට අනුව තේරී පත්වී පාසලට ඇතුලත්වීමට සුදුසුකම් සපුරා තිබුණද 01 වන සහ 02 වන වගඋත්තරකරුගේ ක්‍රියාකලාපයත් හේතුවෙන් එකී අවස්ථාව අහිමිවී ඇති බවද සඳහන් කර ඇත. ඒ අනුව එකී 03 වන වගඋත්තරකාර විද්‍යාලයේ 02 වන ශ්‍රේණියට දරුවාට ඇතුලත්වීමට තිබූ අවස්ථාව අහිමි කර තිබීම සම්බන්ධව සියළු වගඋත්තරකරුවන් කැඳවා පරීක්ෂණයක් සිදුකර තම දරුවාට එකී පාසලට ඇතුලත් වීමට අවස්ථාව හිමිකර දෙන ලෙස පෙත්සම තුලින් ඉල්ලා සිට ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

පෙත්සමට අදාළව වගඋත්තරකරුවන් වෙතින් ඉදිරිපත් කර ඇති 2015.09.30 දිනැති හා අංක ED/1/6/1/9/99(2015) xxxiv දරණ වාර්තාව තුලින් කියා ඇත්තේ 2015 වසර සඳහා ජාතික පාසැල් වලට සිසුන් ඇතුලත් කිරීම සම්බන්ධව 2015.02.09 වන දින ප්‍රධාන පුවත්පත් පහක භාෂා තුනෙන්ම දැන්වීම් පලකළ බවද. ඒ අනුව දෙමාපියන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලද අභියාචනා විශේෂ කමිටුවක් මගින් විමර්ශනය කර සුදුසුකම් සපුරන ලද දරුවන්ට පාසැල් ලබා දෙන ලද බවය. ඒ අනුව මෙම පාසලට ද දරුවන් දෙදෙනෙකු ඇතුලත් කළබව කියා සිටී. විදුහල්පතිවරුන් විසින් තෝරා ගනු ලැබූ සිසුන්ගේ නාම ලේඛන ද අනුමැතිය සඳහා එවා තිබූ බවද ඒවා බොහොමයක් 2008/37 චක්‍රලේඛය ප්‍රකාරව සකස් කර නොතිබූ බවද කියා තිබේ. තවද විදුහල්පතිවරුන් විසින් දරුවන් පාසලට ඇතුලත් කර ගැනීම සඳහා කරන ලද ඉල්ලීම් ඇතුලත් ලේඛනයක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් නියමිත සම්පූර්ණ සුදුසුකම් සපුරා නොතිබීම මත එකී ඉල්ලීම් නොසලකා හැර විදුහල්පති කටයුතු කර ඇති බවට බොහෝ දෙමාපියන් පැමිණිලි කර තිබූ බැවින් ඒ අනුව ඒවා පරීක්ෂා කර බැලීමේදී තහවුරු වී තිබීම මත විදුහල්පතිවරුන් විසින් එවා තිබූ ලේඛන සඳහා **එම අවස්ථාවේ අනුමැතියක් ලබා නොදුන් බව** කියා සිටින ලදී. පෙත්සම්කරුවන්ගේ ඉල්ලීම නොසලකා හරින ලද්දේ ඒ අනුව බව කියා සිටී.

**පරීක්ෂණයේදී අනාවරණය කරගත් කරුණු**

සිතාසි ප්‍රකාරව පාර්ශවයන් කැඳවා පරීක්ෂණ කටයුතු සිදු කිරීමේදී අනාවරණය වූ කරුණු පහත පරිදි වේ.

අවස්ථා කීපයකදී සිතාසි ප්‍රකාරව පාර්ශවයන් කැඳවා පරීක්ෂණ කටයුතු සිදු කර තිබූ අතර. එහිදී 2015.07.16 දින පරීක්ෂණ අවස්ථාවේදී පෙත්සම්කරු විසින් කරුණු ඉදිරිපත් කළපසු වැඩිදුරටත් අනාවරණය වූයේ පැමිණිලිකරුගේ දරුවා පාසලට බඳවා ගැනීමට අදාල සම්මුඛ පරීක්ෂණ පවත්වා පසුව විදුහල්පති විසින් තෝරා ගත් ළමුන් පිළිබඳ වූ නාම ලේඛනය නිර්දේශ කළපසු පැමිණිලිකරුගේ දරුවා ද එයට ඇතුලත්ව සිටි බවයි. නමුත් පසුව අමාත්‍යාංශය විසින් තෝරා ගන්නා ලද ළමුන් පිළිබඳව නම් කළ ලැයිස්තුවේ තම දරුවාගේ නම ඇතුලත්ව නොතිබූ බව පෙත්සම්කරු පෙන්වා දෙන ලදී. පෙත්සම්කරු විසින් කියා සිටින්නේ පවතින චක්‍රලේඛන වලට පටහැනි ලෙස දරුවන් බඳවා ගෙන සිටි බවද චක්‍රලේඛයට අනුව නීත්‍යානුකූලව තෝරා ගෙන තිබූ තම දරුවාට එකී අවස්ථාව අහිමි කර ඇති බවයි. වගඋත්තරකරුවන් කියා සිටින්නේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල වල සේවකයින්ගේ දරුවන් සඳහා මූලිකත්වයක් දෙන බවද. එකී කාර්ය මණ්ඩල වල දරුවන්ට මුල් තැනක් දීම සාධාරණ එකක් ලෙස සලකා කටයුතු කළ බවදය. පරීක්ෂණ අවස්ථාවේදී වගඋත්තරකරුවන් වෙතින් විමසා සිටියේ කාර්ය මණ්ඩල සේවකයින්ගේ දරුවන් බඳවා ගැනීමට අදාල නීතිරීති තිබේද යන්න පිළිබඳවය. නමුත් එවැනි චක්‍රලේඛනයක් හෝ නීතියක් පිළිබඳව කරුණු වගඋත්තරකරුවන් ඉදිරිපත් නොකරන ලදී.

2015.10.16 දින පරීක්ෂණ අවස්ථාවේදී පෙත්සම්කරුවන් විසින් තම දරුවන් තවදුරටත් ශ්‍රී සුමංගල විද්‍යාලයට ඇතුලත් කර ගැනීමට නොහැකිව ඉතා අපහසුතාවයට පත්ව සිටින බව පෙන්වා දෙන අතර. වගඋත්තරකරුවන් එදින ද දරුවන් ඇතුලත් කර නොගැනීමට හේතුවූ කරුණු පිළිබඳව කියා සිටින ලදී. දෙවන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමට අදාලව පවතින අතරමැදි සිසුන් සඳහා සිසුන් බඳවා ගැනීමේ චක්‍රලේඛය හැර වෙනත් චක්‍රලේඛයක් නොමැති බව පරීක්ෂණයේදී විමසීමේදී කියා සිටින ලදී. 2015 වසරේ 02 වන ශ්‍රේණියට පුරප්පාඩු අනුව සිසුන් බඳවා ගැනීමට ලැබී තිබූ ඉල්ලුම් පත් 32 ක් 2015.02.25 දින පැවති සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂා කර බලා 45 ක සීමාවට යටත්ව සිසුන් 7 දෙනෙකු ඇතුලත් කිරීමට අනුමැතිය ඉල්ලා විදුහල්පති විසින් ඉල්ලීමක් යවන ලද බවද අනාවරණය වේ. නමුත් තමාගේ නිර්දේශයට අනුව එක් අයෙකු හෝ ඇතුලත් කිරීමට අමාත්‍යාංශය නිර්දේශ නොකළ බව විදුහල්පති විසින් පෙන්වා දෙන ලද කරුණු අනුව අනාවරණය වේ. නමුත් අදාල ශ්‍රේණි වලට පවතින ඇබෑර්තු සලකා සිසුන් ඇතුලත් කරන ලද්දේ කෙසේද යන්න විමසා සිටීමේදී විදුහල්පති විසින් කියා සිටින්නේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඇතුලත් කිරීමට දන්වා සිටි සිසුන් 6 දෙනෙකු ඇතුලත් කළ බවය. එකී සිසුන් 6 දෙනා තුළ විදුහල්පති මින් පෙර නිර්දේශ කළ සිසුන්ගේ ලැයිස්තුවේ ඇතුලත් කළ සිසුන් 4 දෙනෙකු ද අමාත්‍යාංශය විසින් එවන ලද ලැයිස්තුවේ සිටි බව කියා සිටින ලදී. වගඋත්තරකරුවන් විසින් කියා සිටින්නේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අතරමැදි ශ්‍රේණි සඳහා

සිසුන් බඳවා ගැනීමේදී හෝ පාසැල් වලට සිසුන් බඳවා ගැනීමේදී ඇතිවූ ගැටලු සම්බන්ධව දක්වා දෙමාපියන් විසින් ඉදිරිපත් කළ අභියාචනා සලකා බැලීමට කමිටුවක් පිහිටුවා ඇති බවත් මේ පිළිබඳව 2015.02.15 වන දින ප්‍රසිද්ධ පුවත්පත් මඟින් දැන්වීම් නිකුත් කළ බවද. මාර්තු මස 06 වන දිනට පෙර අසාධාරණයට ලක්වූ දරුවන්ගේ අභියාචනා සලකා බලන බව දක්වා තිබූ බවද පෙන්වා දෙන ලදී. නමුත් මෙම පෙත්සම්කරු ඒ සඳහා අයදුම් කර නොතිබූ බවද කියා සිටින ලදී. නමුත් මෙහිදී පෙත්සම්කරු විසින් කියා සිටින ලද්දේ තම දරුවන් මෙම පාසලට ඇතුළත් කිරීමට අදාලව පැවති සම්මුඛ පරීක්ෂණයේදී තෝරා ගත් බව නිර්දේශ කර විදුහල්පතිතුමා දක්වා තිබූ බැවින් අසාධාරණයක් සිදුවූ බව තමාට අදාල නොවන බැවින් එවන් අභියාචනාවක් සිදු කිරීමේ අවශ්‍යතාවයක් පෙන්වා දෙන ලදී.

විදුහල්පති විසින් නිර්දේශ කළ සිසුන් බඳවා ගැනීමට අවසර ඉල්ලා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලද ලේඛනයට කුමක් වීද යන්න පරීක්ෂණ අවස්ථාවේදී විමසා සිටි අතර 02 වන වගඋත්තරකරු කියා සිටින්නේ එය නොසලකා හරින ලද බවද ළමුන් එක් පන්තියකට 40 ක් බැගින් වූ සීමාව යටතේ පමණක් විදුහල්පතිගේ නිර්දේශයක් සලකා බැලිය හැකි බවදය. එසේ නම් දැනට මෙම විදුහලේ 02 වන ශ්‍රේණියේ ළමුන් 40 කට වඩා වැඩි ප්‍රමාණයක් සිටින්නේ හා අමාත්‍යාංශයේ අභියාචනා කමිටුව විසින් 40 ක සීමාවට වඩා වැඩිපුර සිසුන් බඳවා ගැනීමට දන්වා සිටින්නේ කෙසේද යන්න විමසා සිටින ලදී. 02 වන වගඋත්තරකරු කියා සිටින්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතු අභිමතය යටතේ අසාධාරණ තත්වයන් සලකා බලා සුදුසු පියවරක් ලෙස එය සිදු කරන බවයි. අභියාචනා කමිටුව පිහිටුවා ඇත්තේ යම් චක්‍රලේඛයකට අනුවද යන්න විමසා සිටියද 02 වන වගඋත්තරකරු එයට පිළිතුරු දීමට අපොහොසත් වේ.

චක්‍රලේඛය අනුව පාසලට ළමුන් ඇතුළත් කිරීමට අයදුම්පතක් ඉදිරිපත් කිරීමට ඇති හැකියාව යටතේ ඉල්ලීමක් සිදුකල බවද. පුවත්පත් වල තිබූ අභියාචනා කමිටු රැස්වීමක් පිළිබඳ දක්වා ඇතත් එකී අභියාචනා කමිටුව තිබුණේ අසාධාරණයට ලක්වූ දරුවන් වෙනුවෙන් බැවින් එකී කමිටුවට යාමට අවශ්‍යතාවයක් නොමැති බව පෙන්වා දෙන ලදී.

**නිරීක්ෂණ**

පෙත්සම්කරුගේ දරුවා පානදුර ශ්‍රී සුමංගල විද්‍යාලයේ 02 වන ශ්‍රේණියට ඇතුළත් කිරීමට ඉල්ලුම් කර තිබියදී ඒ සඳහා අදාල සම්මුඛ පරීක්ෂණයට ද පෙත්සම්කරු ඉදිරිපත්ව සිටි බව තහවුරු වේ. 03 වන වගඋත්තරකරු විසින් සම්මුඛ පරීක්ෂණයට අනුව පාසලට බඳවා ගැනීමට සුදුසුකම් ලත් අයදුම් පත් 07 ක් වෙනුවෙන් නිර්දේශය ඉල්ලා යවා තිබියදීත් 01 වන සහ 02 වන වගඋත්තරකරුවන් විසින් එය නොසලකා හැර ඇති බව ඔවුන් විසින් කියා සිටි කරුණු අනුව

තහවුරු වේ. අභියාචනා කමිටුව යන්න අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යන ලද කමිටුවක් පමණක් වන අතර. එය චක්‍රලේඛයක් ප්‍රකාරව පිහිටුවා ඇති එකක් බව පෙන්වා දීමට වගඋත්තරකරුවන් අපොහොසත් වේ. එකී කමිටුව කටයුතු කරන ආකාරය අනුව පෙනී යන්නේ අසාධාරණයට ලක්වූ අයදුම්කරුවන්ගේ අභියාචනා පමණක් සලකා බලන බවය. සුමංගල විද්‍යාලයේ 02 වන ශ්‍රේණියට තෝරා ගත් අයදුම්කරුවන්ගේ දරුවන් ඇතුලත් කිරීමට අනුමැතිය සඳහා අමාත්‍යාංශයට යවා තිබූ බැවින් අසාධාරණයක් තවදුරටත් නොපෙනෙන බැවින් එම තෝරා ගත් අයදුම්කරුවන් අභියාචනා කමිටුවකට අයදුම් කිරීමේ අවශ්‍යතාවයක් නොදකින බව පෙන්වා දිය යුතුය. අභියාචනා කමිටුව විසින් සලකා බැලිය යුතු කාරණාවක්ව තිබුණේ සුමංගල විද්‍යාලයේ 02 වන ශ්‍රේණියට දරුවන් ඇතුලත් කිරීමට පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය තුලින් යම් අසාධාරණයක් අයදුම්කරුවන්ට සිදු කර තිබුණේ නම් ඒ බව සියලු පාර්ශවයන්ට දන්වා එකී සියලු අයදුම්පත් නැවත අභියාචනා කමිටුවට ඉදිරිපත් කරන ලෙස දැනුම් දී පෙත්සම්කරුගේ අයදුම්පත ද නැවත සලකා බැලීමට ඉඩ තිබූ බවය. නමුත් ඒ සම්බන්ධව පෙත්සම්කරු හට කිසිදු දැනුම්දීමක් සිදු කර තිබී නැති අතර. චක්‍රලේඛය ප්‍රකාරව අයදුම් කළ පසු සම්මුඛ පරීක්ෂණයේදී තම දරුවාගේ නම නිර්දේශ වී තිබීම මත සාධාරණයක් ඉටුවී තිබූ බැවින් ඒ අනුව අභියාචනා කමිටුවකට අයදුම් කිරීමේ අවශ්‍යතාවයක් පෙත්සම්කරුට ඇති නොවන බව ද පෙන්වා දිය යුතුය.

**නිගමනය**

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් කරන ලද විධායක හා පරිපාලන ක්‍රියාවන් හේතු කොට ගෙන පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බව එය 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් නීතියේ රැකවරනය උල්ලංඝණය වීමක් බවද පෙන්වා දිය යුතුය. ඒ අනුව තවදුරටත් පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් කඩවීම වැලැක්වීම සඳහා පහත සඳහන් පරිදි කටයුතු කිරීමට මින් දන්වා සිටිමි. එනම්.

**නිර්දේශය**

පෙත්සම්කරුගේ දරුවා වන කේ. දුල්වන් ලිත්නුක පානදුර ශ්‍රී සුමංගල විද්‍යාලයේ 2015 වසරේ 02 වන ශ්‍රේණියට හෝ 2016 වසරේ 03 වන ශ්‍රේණියට අදාලව බඳවා ගැනීම් සිදු කලයුතු බවට මින් නිර්දේශ කරමි.

2016.02.07 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු:

සභාපති.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

HUMAN RIGHTS COMMISSION
OF SRI LANKA

CHAIRMAN

COMMISSIONERS